# ජාතික රාජ්‍ය සභාවේ 1972 අංක 11 දරන
# අවිනිශ්චිත අවස්ථා අරමුදල් පනත

[සහතිකය සටහන් කළේ 1972 දෙසැම්බර් මස 12 වන දින]

ආණ්ඩුවේ නියමය පරිදි මුද්‍රණය කරන ලදී.

(1972 දෙසැම්බර් මස 29 වැනි දින ශ්‍රී ලංකා ජනරජයේ ගැසට් පත්‍රයේ II වැනි කොටසේ අතිරේකයක් වශයෙන් පළ කරන ලදී.)

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී

කොළඹ රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිළ දී ලබාගත හැකිය.

# ජාතික රාජ්‍ය සභාවේ 1972 අංක 11 දරන අවිනිශ්චිත අවස්ථා අරමුදල් පනත

[සහතිකය සටහන් කළේ 1972 දෙසැම්බර් මස 12 වන දින]

එල්. ඩී.—ඕ. 47/72.

**අවිනිශ්චිත අවස්ථා අරමුදලක් ඇති කිරීම පිණිස ද ඊට සම්බන්ධ කරුණු සඳහා විධිවිධාන සැලැස්වීම පිණිස ද වූ පනතකි.**

ශ්‍රී ලංකා ජනරජයේ ජාතික රාජ්‍ය සභාව විසින් මෙසේ පනවනු ලැබේ :—

**1.** මේ පනත ජාතික රාජ්‍ය සභාවේ 1972 අංක 11 දරන අවිනිශ්චිත අවස්ථා අරමුදල් පනත යනුවෙන් හඳුන්වනු ලැබේ.

*ලුහුඬු නාමය.*

**2.** (1) ශ්‍රී ලංකා ආණ්ඩු ක්‍රම ව්‍යවස්ථාවේ 87 (1) වන වගන්තිය අනුව අවිනිශ්චිත අවස්ථා අරමුදලක් මෙයින් ඇති කරනු ලැබේ.

*අවිනිශ්චිත අවස්ථා අරමුදල.*

(2) ඒකාබද්ධ අරමුදලින් රුපියල් දෙකෝටියක මුදලක් අවිනිශ්චිත අවස්ථා අරමුදලට ගෙවනු ලැබිය යුතු අතර ඒ මුදල අවිනිශ්චිත අවස්ථා අරමුදලෙහි කොටසක් විය යුතු ය.

(3) ජාතික රාජ්‍ය සභාව විසින් කලින් කල සම්මත කරනු ලැබිය හැකි සියලු මුදල් එකී අවිනිශ්චිත අවස්ථා අරමුදලට බැර කරනු ලැබිය යුතු ය.

**3.** 1948 අංක 14 දරන පනතින් ඇති කරන ලද අවිනිශ්චිත අවස්ථා අරමුදලින් ගෙවන ලදුව මේ පනත ක්‍රියාත්මක වීම ආරම්භ වන දිනය වන විට ප්‍රතියෝජනය කර නොමැති සියලු අත්තිකාරම් මුදල් මේ පනතින් ඇති කරන ලද අවිනිශ්චිත අවස්ථා අරමුදලින් ගෙවන ලද අත්තිකාරම් මුදල් ලෙස සැලකිය යුතු ය. ඒ අනුව ශ්‍රී ලංකා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 87 වන වගන්තියේ (3) වන උප වගන්තියේ විධිවිධාන ඒ අත්තිකාරම් මුදල් කෙරෙහි අදාළ විය යුතු ය.

*1948 අංක 14 දරන පනතින් ඇති කරන ලද අවිනිශ්චිත අවස්ථා අරමුදලින් ගෙවන ලද ඇතැම් අත්තිකාරම් මුදල් මේ පනතින් ඇති කරන ලද අවිනිශ්චිත අවස්ථා අරමුදලින් ගෙවන ලද අත්තිකාරම් මුදල් ලෙස සැලකිය යුතු බව.*

**4.** අවිනිශ්චිත අවස්ථා අරමුදල මුදල් විෂය භාර අමාත්‍යාංශයේ ලේකම්වරයාගේ භාරයෙහි තිබිය යුතු අතර ඒ පිළිබඳ ගිණුම් ඔහු විසින් තබා ගත යුතු ය :

*අවිනිශ්චිත අවස්ථා අරමුදලෙහි භාරය හා ගිණුම්.*

එසේ වුව ද අරමුදල හා සම්බන්ධ ස්වකීය බලතල හා යුතුකම් අතුරින් කවර වූ හෝ බලයක් හෝ යුතුකමක් එකී ලේකම්වරයා විසින් යම් රාජ්‍ය නිලධාරියකුට පවරා දෙනු ලැබිය හැකි ය.

1*—කේ 17378—8,824 (72/10)